මගේ අංකය - 010/10/03/01

නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය,
හුරුළුවැව ව්‍යාපාරය,
ගලෙන්බිඳුණුවැව,
2019.03.06

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ
සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත.

<u>2019 - මාර්තු මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව.</u>

හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකාර ඊ.එම්.ඩබ්.කේ. ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් මාර්තු මස 5 වන දින පෙ.ව 9.30ට පමණ හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

පළමුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් පැමිණ සිටි සියලුම රාජ්‍ය නිලධාරීන් හා ගොවි සංවිධාන නිලධාරීන් පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

<u>සහභාගී වූ රාජ්‍ය නිලධාරීන්</u>

| | | |
|---|---|---|
| 01 | ඊ.එම්.ඩබ්ලිව්.කේ.ඒකනායක මහතා | නේවාසික ව්‍යාපෘති කළමනාකරු, හුරුළුවැව. |
| 02 | එච්.විජිත් කොඩිතුවක්කු මහතා | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු හුරුළුවැව. |
| 03 | ටී.එම්.එල්.එම්. දිසානායක මහතා | කෘෂිකර්ම උපදේශක, කෘ.උ.කාර්යාලය, ගලෙන්බිඳුනුවැව. |
| 04 | එස්.එම්.ඩී.එන්. කොඩිරත්න මහතා | කෘෂිකර්ම උපදේශක, කෘ.උ.කාර්යාලය, ගලෙන්බිඳුනුවැව. |
| 05 | ඒ.එල්.ඩී.එස්.සම්පත් මහතා | ඉංජිනේරු සහකාර,ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, හුරුළුවැව |
| 06. | ජී. එම්. චිත්‍රජීව මහතා | ඉංජිනේරු සහකාර,ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, හුරුළුවැව |
| 07 | එම්.ඩී.එම්.ඩී.නිශ්ශංක මහතා | ඉංජිනේරු සහකාර,ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, හුරුළුවැව |
| 08 | ඩබ්.ඒ.ජී.කේ ප්‍රියදර්ශනී මිය | සංවර්ධන නිලධාරී නේවාසික ව්‍යාපෘති කළ.කාර්යාලය |
| 09 | ඒ.ඩී.සිරිපාල මිය | සංවර්ධන නිලධාරී නේවාසික ව්‍යාපෘති කළ.කාර්යාලය |
| 10 | ටී.ඒම්.ඒ.උදයංගනී මිය | සංවර්ධන නිලධාරී නේවාසික ව්‍යාපෘති කළ.කාර්යාලය |
| 11 | ටී.එම්.එම්. තෙන්නකෝන් මහතා | ප්‍රාදේශීය කළමනාකරු,(වී අලෙවි මණ්ඩලය) |
| 12 | පී.එච්.මොහොමඩ් මහතා | පරිපාලන ග්‍රාමනිලධාරී, ප්‍රා.ලේ.කාර්යාලය |
| 13 | කේ.ප්‍රේමරත්න මහතා | වාරිමාර්ග ජලපාලක, |
| 14 | එච්.එම්.එස්.පී.ජයසිංහ | වාරිමාර්ග ජලපාලක |
| 15 | ඩී.එම්.අබේපාල මහතා | වාරිමාර්ග ජලපාලක |
| 16 | ඩබ්. එම්. වීරසිංහ මහතා | වාරිමාර්ග ජලපාලක |
| 17 | එච්.එච් අබේරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 18 | ඩබ්.එම්.ගුණරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 19 | ඩී.එම්.නිමල්රත්න බංඩාර මහතා | වාරිමාර්ග ජලපාලක |
| 20 | එම්.තුෂාර ධර්මප්‍රිය මහතා | වාරිමාර්ග ජලපාලක |
| 21 | ඒ.ධනපාල මහතා | වාරිමාර්ග ජලපාලක |
| 22 | ඒ.එම්.ඥානවතී මිය | දත්ත කළමනාකරු |

<u>සහභාගී වූ ගොවි සංවිධාන නිලධාරීන්</u>

| | | |
|---|---|---|
| 01 | එම්.වයි. ජී.සෝමපාල මහතා | සභාපති,හුරුළුනිකවැව ඩී 06 ගොවි සංවිධානය |
| 02 | එන්.කේ.ජී. ජයතිලක මහතා | භාණ්ඩාගාරික, හුරුළුනිකවැව ඩී 06 ගොවි සංවිධානය |
| 03 | ඒ.ඩබ්.අබේසිංහ මහතා | ලේකම්, හුරුළුනිකවැව ඩී 06 ගොවි සංවිධානය |
| 04. | බී.ජයතිස්ස තෙන්නකෝන් මහතා | සභාපති,රන්කෙත ගොවි සංවිධානය |
| 05 | ඩබ්.ජී.සුනිල් ධර්මසිංහ මහතා | සභාපති,ඩී 11 දුටුවැව ගොවි සංවිධානය |
| 06 | ඩී.පී.ඒ. සේනාරත්න මහතා | සභාපති,මහසෙන් ගොවි සංවිධානය |
| 07 | කේ.පී.ධර්මදාස මහතා | ලේකම්,යාය 06,21 ජනපදය ගොවි සංවිධානය |

| | | |
|---|---|---|
| 08. | ඩී. ප්‍රියන්ත රණසිංහ මහතා | ලේකම්, අළුත්දිවුල්වැව ගොවි සංවිධානය |
| 09 | එච්.එම්.පී.සිරිපාල මහතා | සභාපති, වම් ඉවුර යාය 05 ගොවි සංවිධානය |
| 10 | පී. පුංචිබංඩා මහතා | භාණ්ඩාගාරික, වම් ඉවුර යාය 05 ගොවි සංවිධානය |
| 11 | ඊ.එම්.ආර්.මල්ලවතිස්ස මහතා | භාණ්ඩාගාරික, කොකාවැව ඩී 10, ගොවි සංවිධානය |
| 12 | ආර්.එම්. තිලකරත්න මහතා | ලේකම්,කොකාවැව ඩී 10, ගොවි සංවිධානය |
| 13 | කේ.බී. තිලකරත්න මහතා | භාණ්ඩාගාරික, ගලෙන්බිදුනුවැව ඩී 07 ගොවි සංවිධානය |
| 14 | ඩී.කේ.කාවින්ද අබේරත්න මහතා | සභාපති,ජනසිරිගම ගොවි සංවිධානය |
| 15 | පී.සුනිල් ප්‍රේමරත්න මහතා | ලේකම්, එකමුතු යාය 06 ගොවි සංවිධානය |
| 16 | ඩී.එම්.සම්පත් නිශාන්ත මහතා | සභාපති, මිගහපට්ටිය ගොවි සංවිධානය |
| 17 | විලියම් රණවීර මහතා | ලේකම්, උල්පත්ගම රණමයුර ගොවි සංවිධානය |
| 18 | යූ.බී.ජයසේන මහතා | ලේකම්, ගලෙන්බිදුනුවැව ඩී 07 ගොවි සංවිධානය |
| 19 | සුසන්ත රංජිත් මහතා | ලේකම්, ඩී 11 දුටුවැව ගොවි සංවිධානය |
| 20 | ආර්.ඩී.අප්පුහාමි මහතා | සභාපති, ගලෙන්බිදුනුවැව යාය 07 ගොවි සංවිධානය |
| 21 | එම්.සේනාරත්න මහතා | භාණ්ඩාගාරික,මිගහපට්ටිය ගොවි සංවිධානය |
| 22 | ජේ. කරුණාරත්න මහතා | භාණ්ඩාගාරික, උල්පත්ගම රණමයුර ගොවි සංවිධානය |
| 23 | කේ.කරුණාරත්න මහතා | සභාපති, උල්පත්ගම රණමයුර ගොවි සංවිධානය |
| 24 | ආර්.ඒ.පී.කේ.රණවක මහතා | සභාපති,දුටුවැව ඩී12- 13 පැරකුම් ගොවි සංවිධානය |
| 25 | එච්.එම්.කරුණාරත්න මහතා | සභාපති,ගැමුණු ගොවි සංවිධානය |
| 26 | එම්.ඩී.ඒ.සේනගුණරත්න මහතා | සභාපති,ඩී නිකවැව 05 ගොවි සංවිධානය |
| 27 | ඒ.ඒ.කුමාරසිංහ මහතා | සභාපති, සමගි ගොවි සංවිධානය |
| 28 | එච්.එම්.විමල් චන්ද්‍රසිරි මහතා | සභාපති, යාය 06 21 ජනපදය ගොවි සංවිධානය |
| 29 | කේ.හේමරත්න මහතා | සභාපති,කිවිලේකඩ ගොවි සංවිධානය |

<u>පසුගිය කමිටු රැස්වීම් වාර්තාව</u>

පසුගිය කමිටුවේ රැස්වීම් වාර්තාව සමාලෝචනය කරන ලදී.

<u>ලිපි ලැබීම්.</u>

ලිපි ලැබී නැත.

<u>ආයතන සංවර්ධන කටයුතු - සංවර්ධන නිලධාරි ටී.එම්.ඒ.උදයංගනී මිය.</u>
<u>(පසුගිය මස ප්‍රගතිය)</u>

| කාරණය | ප්‍රගතිය |
|---|---|
| කාරක සභා රැස්වීම් පැවැත්වීම. | 13 |
| මුදල් සාරාංශ වාර්තා සැකසීම. | 20 |
| විගණන කටයුතු සඳහා පොත්පත් භාර දීම. | 16 |
| පෙර කන්න රැස්වීම පැවැත්වීමට (දිවුල්වැව) | 01 |

<u>මාසයේ සිදු කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්</u>

★ වාරිමාර්ග ඵලදායිතා ව්‍යාපෘතියට අදාලව ඉදිකිරීම් කළමනාකරණ පුහුණුව සඳහා ගොවි නායකයින් ගොවීන් 31 දෙනෙකු කොත්මලේ වාරිමාර්ග ජාත්‍යන්තර පුහුණු ආයතනයේ පැවති පුහුණුව සඳහා සහභාගි කරවීම.

<u>ඉදිරි මාසයේදී පැවැත්වීමට අපේක්ෂිත ආයතන සංවර්ධන කටයුතු</u>

| කාරණය | ඉලක්ක | වගකීම |
|---|---|---|
| කාරක සභා පැවැත්වීම | 20 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරීන් |
| මාසික මුදල් සාරාංශ සැකසීම | 20 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරීන් |
| පෙර කන්න රැස්වීම් පැවැත්වීම. | 02 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරීන් |
| විගණනය සඳහා පොත් භාර දීම. | 04 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, සංවර්ධන නිලධාරීන් |

ලෝක ජල දිනය තේමා කර ගත් වැඩසටහන් ලෙස ගොවීන් දැනුවත් කිරීම හා ශ්‍රමදාන පැවැත්වීමට ව්‍යාපෘතියට අදාලව ඒකාබද්ධ ක්‍රියාත්මක සැලැස්ම හා පදනම් දත්ත සමීක්ෂණ පැවැත්වීම.

වාරිමාර්ග කටයුතු - ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විජිත් කොඩිතුවක්කු මහතා

| ජලාශය | උසින් අඩි | අක්කර අඩි |
|---|---|---|
| හුරුළුවැව | 24.15 | 44025 |
| කිවුලේකඩ වැව | 16.5 | 4830 |
| අලුත් දිවුල්වැව | 23.5 | 6202 |

ජලාශයන්හි අද දිනට පවතින ජල තත්ත්වය පිළිබඳව විස්තර දක්වමින්, පසුගිය කන්නයේ මේ වන විට 50% ක පමණ අස්වනු නෙළීම අවසන් බව හා වාර්තා තොරතුරුවලට අනුව සාර්ථක කන්නයක නිමාව බවත් කන්නයේ අක්කරයක් සඳහා ජල කාර්යය අක්කර අඩි 2.28 ක් බව පවසමින් කන්නය පිළිබඳව සතුටු වන බව ප්‍රකාශ කරන ලදී.එසේම අද දින2019 යල පෙර කන්න තීරණ ගැනීමට නියමිත බැවින්,2019- යල කන්නය ව්‍යාපාරයේම වී වගා කිරීමට අක්කර අඩි 54600 අවශ්‍ය බවත්, පවතින ජල ධාරිතාවය මත 50% වී වගාවටත්,50% අතිරේක බෝග වගාවටත් යොමු වීමට හැකි බව පවසන ලදී.එසේම ගොවීන්ගේ ඉල්ලීම මත කන්නය ආරම්භ කිරීමට පෙර ජල පාලනය පිළිබඳව පුහුණු සැසියක් පැවැත්වීමට කටයුතු කරන බවද ප්‍රකාශ කරන ලදී.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | ඉටු කිරීමට ගත වන කාලය |
|---|---|---|---|---|
| පඩිකාරමඩුව ගැමුණු ගොවි සංවිධානයේ සභාපති කරුණාරත්න මහතා | යල් කන්නයේ සිට ජලය වැවේ මුල ගො. සං. සිට ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | | | |
| නිකවැව ඩී 05 ගොවි සංවිධානයේ සභාපති සේන ගුණරත්න මහතා | ඔම ගොවි සංවිධානයේ බල ප්‍රදේශයේ ලෝක ආධාර ව්‍යාපෘතිය යටතේ fc 40 ඉදිකිරීම් සිදුවන බවත්,ඒ හරහා ඇල බැම්ම හා පාර සකස් කර දෙන ලෙස | අවශ්‍ය කටයුතු පිළිබඳව සොයා බලන බව. | වා. ඉං | |
| නිකවැව ඩී 06 ගොවි සංවිධානයේ සභාපති සෝමපාල මහතා | කුඹුරු බව යොදා සකස් කිරීම සඳහා මිනුම් ලබා දෙන ලෙස. | අවශ්‍ය කටයුතු පිළිබඳව සොයා බලන බව. | වා. ඉං | |
| ජනසිරිගම ගොවි සංවිධානයේ සභාපති කෘවින්ද මහතා | දිවුල්වැවෙන් පහල දකුණු ඇලේ ප්‍රධාන ඇල ගිරොන් මඩ ඉවත් කර දෙන ලෙස. | දිවුල්වැවේ 1/7 ඇල අඩි 2 1/2 උසින් පවතින බව හා පහලට ගලා යාම බාධා ඇතිවන නිසා විසඳුමක් ගන්නා බව. | වා. ඉං | |
| කොකාවැව ගොවි සංවිධානයේ ලේකම් තිලකරත්න මහතා සහ භාණ්ඩාගාරික මල්ලවතිස්ස මහතා | ඉදිරි කන්නය ජලය බෙදා ගැනීමේදී ගැටළු ඇතිවන බව වාරිමාර්ග නිලධාරින්ගේ (ජලපාලක වැඩපරිපාලක) හිඟ බව ඔහුන් ලබා දෙන ලෙස,ජයන්තිය,යාන්ඔයේ ඉදිකිරීම් පිළිබඳව හා ඩී 10 උස්ගල ප්‍රදේශයට ජලය රැගෙන යාම අපහසු බව. | | | |
| කිවිලේකඩ ගොවි සංවිධානයේ සභාපති හේමරත්න මහතා | වැව් රක්ෂිත වෙන් කිරීම මගින් අපේ උරුමයන් රැකගත හැකි බව. | | | |
| දූටුවැව ඩී 12,13 ගොවි සංවිධානයේ සභාපති රණවක මහතා | 479 අමුණ (ජයම්පති මහතාගේ අමුණ) පිළිබඳ ප්‍රශ්නය හා එමගින් යල් කන්නයේ ඇතිවන ගැටළුව | | | |
| දූටුවැව ඩී 11 ගොවි සංවිධානයේ සභාපති සුනිල් ධර්මසිංහ මහතා | ඩී 11 ගොවි සංවිධානය වැවේ සිට 24 Km දුරින්ම පිහිටි ගො.සං. බවත් බෙදුම් ඇල,කෙත් ඇලවල් හරහා ජලය ගෙන යාමේ අපහසුතාවය පිළිබඳවත්, ප්‍රධාන ඇලේ බොක්කුව නිසා ජලය ගෙන යාමේ අපහසුවත් දීර්ඝ ලෙස අදහස් දැක්වීම. | | | |

| | | | | |
|---|---|---|---|---|
| මීගහපට්ටිය ගොවි සංවිධානයේ සභාපති නිශාන්ත සහ භාණ්ඩාගාරික සේනාරත්න මහතා | ලෝක ආධාර ව්‍යාපෘතිය යටතේ D 01- .fc 1 ට්‍රැක්ටර් පැන්නුම් 2 ඉදි කිරීම පිළිබඳව වම් ඉවුර සඳහා පෙර පරිදිම අග ගො.සං. සිට ජලය ලබා දීම සුදුසු බවත්, fc 4 අමුණ සකස් කිරීම සඳහා JCB අවශ්‍ය බව. | අමුණ සම්බන්ධව ලිපියක් ලබා දෙන ලෙස. | වා. ඉං | |
| ගලෙන්බිඳුණුවැවගොවි සංවිධානයේ ලේකම් ජයසේන මහතා | කන්නිමඩුව වැව නිසා ජනපද ඉඩම් යට වීම පසුගිය කන්නයේ අක්කර 15 යට වීම යල් කන්නයේ හෝ විසඳුමක් ලබා දෙන ලෙස. | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට යාමට හෝ දිස්ත්‍රික් ලේකම්තුමා හමු වී විසඳුමක් ලබා ගැනීමට සාකච්ඡා විය. | . | |
| උල්පත්ගම ගොවි සංවිධානයේ සභාපති කරුණාරත්න මහතා සහ භාණ්ඩාගාරික ජේ.කරුණාරත්න මහතා | ඉහළගම වැව සම්බන්ධ ගැටළු පවතින බව යල් කන්නයේ වැවට ජලය දීමට නොහැකි බව හා fc 4 ඇල නඩත්තු කටයුතු පිළිබඳව විමසන ලදි. | ප්‍රාදේශීය නිළධාරි සමඟ සාකච්ඡා කිරීමට තිරණය විය. | . | |

<u>කෘෂකර්ම කටයුතු - මූලස්ථාන කෘෂිකර්ම උපදේශක දිසානායක මහතා</u>

පෙර මහට වගා කිරීම ඉහල අස්වැන්නක් ලබා සාර්ථක කන්නක් කර ගැනීමට හේතු වූ බව සඳහන් කරමින් වැවේ පවතින ජල ධාරිතාවය අනුව අතිරේක බෝග වගාවට වැඩි වශයෙන් යොමු වීම වැඩි ආදායමක් ලබා ගැනීමට හැකි බවත් , අතිරේක බෝග වගාව මැයි 15 දක්වා සිටවීම සුදුසු බවත්, වගල් කුඹුරු සඳහා වී මාස 3 1/2,3 හා අතිරේක බෝග වගාව ලෙස සෝයා හා බඩඉරිඟු වගා කිරීම සුදුසු බව වැඩි දුරටත් පවසන ලදී.

| ඉදිරිපත් කළ අය | කාරණය | තිරණය | වගකීම | ඉදු කිරීමට ගත වන කාලය |
|---|---|---|---|---|
| නිකවැව ඩී 06 ගොවි සංවිධානයේ සභාපති සෝමපාල මහතා | සෝයා අලෙවිය පිළිබඳව නිසි ක්‍රමවේදයක් සැලසිය යුතුයි. | | | |
| ජ්ලෙන්ටි පුඩ් ආයතනය ප්‍රා දේශිය කළමණාකරු අධිකාරි මහතා | මෙවර අක්කර 1000 ක් සඳහා ජ්ලෙන්ටි පුඩ් ආයතනය ගිවිසුම් ගත වීමට හා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන බව. | | | |
| ගලෙන්බිඳුණුවැවගොවි සංවිධානයේ ලේකම් ජයසේන මහතා | ජ්ලෙන්ටි පුඩ් ආයතනයේ අවශ්‍ය ද්‍රව්‍ය බෙදා හැරීම ගොවි සංවිධාන හරහා සිදු කරන ලෙස. | | | |
| නිකවැව ඩී 06 ගොවි සංවිධානයේ ලේකම් අබේසිංහ මහතා | හුරුළු ගොවි සමාගම මගින් අමාත්‍යාංශය හරහා ත්‍රිපෝෂ නිෂ්පාදනයට සෝයා අලෙවි කිරීමට සාකච්ඡා කරන ලෙස. | | | |
| ජනසිරිගම ගොවි සංවිධානයේ සභාපති කාවින්ද මහතා | ගොවින්ට සෝයා අලවිය මගින් සාධාරණ මිලක් කටයුතු කරන ලෙස | | | |
| එකමුතු ගොවි සංවිධානයේ ලේකම් සුනිල් මහතා | ක්ෂේත්‍රය තුල ප්‍රායෝගික ගැටළු පවතින බැවින් ජලය නිකුත් කිරීමට පෙර බිම් සකස් කිරීම සුදුසු බව. | | | |
| උල්පත්ගම ගොවි සංවිධානයේ සභාපති ජේ.කරුණාරත්න මහතා | මැයි මාසයට බීජ සිමුවීම සඳහා ගොවින් යොමුවනා බව. | ගොවින් දැනුවත් කිරිම. | අදාල නිලධාරින් | |

★ කිච්ලේකඩ ගොවි සංවිධානයේ සභාපති හේමරත්න මහතා
මේ දිනවල වෙළඳපොලේ යූරියා නොමැති බව හා කොමර්ෂල් පොහොර සමාගම හරහා ප්‍රාදේශිය නිලධාරින් මඟින් පෙහොර ලබා ගැනීමට කටයුතු කර දෙන ලෙස ඉල්ලීම් කරන ලදි

පෙර කන්නය පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ජා කිරිමෙන් පසු පෙර කන්න තිරණ පහත පරිදි තිරණය විය.එය ජනසිරිගම ගොවි සංවිධානයේ සභාපති කාවින්ද මහතාගේ සහ මහසෙන් ගොවි සංවිධානයේ සභාපති සේනාරත්න මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාසම්මත විය.

<u>හුරුළුවැව ව්‍යාපාරය.</u>

<u>හුරුළුවැව ව්‍යාපාරය - 2019 යල කන්නය.</u>

| | | පෙර කන්න රැස්වීමේ තිරණ (2019/03/05) |
|---|---|---|
| 01. | වගා කළ යුතු බිම් ප්‍රමාණය | සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය අක්කර 10400 |
| 02. | කන්නය සඳහා සුදුසු බෝගය | වී මාස 3 1/2 , 3 අතිරේක බෝග |
| 03. | ඇලවේලි ශුද්ධ කිරිම - ගොවීන් විසින් | 2019/04/22 ට පෙර |
| 04. | ගොවීන් විසින් ශුද්ධ නොකරන ලද ඇලවේලි ගො.ස. මඟින් ශුද්ධ කිරීම | 2019/04/25ට පෙර |
| 05. | ජලය නිකුත් කිරීමේ යෝජිත දිනය | 2019.04.25 |
| 06. | වපුරා හෝ පැල සිටුවා අවසන් කළ යුතු දිනය | 2019.05.16 |
| 07. | මුරජලය නිකුත් කිරීමේ ආරම්භක දිනය. | 2019.05.19. |
| 08. | යායෙන් ට්‍රැක්ටර් ඉවත් කිරීමේ දිනය | 2019.05.16 |
| 09. | වගා රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2019.05.16 |
| 10 | මුර ජලය නිකුත් කිරීමේ අවසන් දිනය | 2019/08/14 |
| 11 | වගා හානි දැනුම් දීමේ අවසන් කළ යුතු දිනය | 2019/08/14 |
| 13. | අස්වනු නෙළීම අවසන් කළ යුතු දිනය | 2019/09/05 |
| 14. | ඇලවේලි ශුද්ධ නොකිරීමේ දඩය | බඹයට රු.100 |
| 15. | සංවර්ධන මුදල් අක්කරයට | රු.300 |
| 16. | වාරිමාර්ග නිර්මිත හානි වලට අය කරනු ලබන දඩය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව තක්සේරුව මත |
| 17. | කන්න රැස්වීම පැවැත්වීමට යෝජිත දිනය | 2019.04.03 |
| 18 | සාමාජික මුදල් වර්ෂයට | රු.100 |
| 19. | පිදුරු ගිනි තැබීමේ දඩය | අක්කරයකට රු.1000 |
| | යෝජනා කිරීම. | ජනසිරිගම ගොවි සංවිධානයේ සභාපති කාවින්ද අබේරත්න මහතා |
| | ස්ථිර කිරීම. | මහසෙන් ගොවි සංවිධානයේ සභාපති සේනාරත්න මහතා |

<u>වී අලෙවි මංඩලය - ප්‍රාදේශිය නිලධාරි තෙන්නකෝන් මහතා</u>

පෙබරවාරි මස 18 දින සිට වී මිළදි ගන්නා බවත්,යකල්ල හා ගලෙන්බිඳුණුවැව ගබඩා 2 කම සතියේ දින 6ක් විවෘතව තබන බව නාඩු මිළ රු.38.00 හා සම්බා මිළ රු.41.00 බවත්, වී මිළදි ගන්නි ක්‍රමවේදය හා මුදල් ලබා දීම පිළිබඳව පැහැදිලි කරන ලදි.

පාරිපාලන ග්‍රාම නිලධාරි මොහොමඩ් මහතා

පසුගිය කන්නය පිලිබඳව සතුටුවන බවත්, ඉදිරි අවශ්‍ය කටයුතු සිදු කිරිමට සැලසුම් කරන බව යල් කන්නය සාර්ථක වේවා හා ගැටළු නැති වසරක් වේවා ලෙස මොහොමඩ් මහතා ප්‍රකාශ කරන ලදී.

| ඉදිරිපත් කළ අය | කාරණය | තිරණය | වගකිම | ඉටු කිරිම ගත වන කාලය |
|---|---|---|---|---|
| නිකවැව ඩී 06 ගො.ස ලේකම් අබේසිංහ මහතා, ,දූටුවැව ඩී 12-13 ගො.ස.සභාපති රණවක මහතා, ජනසිරිගම ගො.සං. සභාපති කාවින්ද මහතා, | ගොවි සංවිධාන උප කොන්ත්‍රාත් ලියාපදිංචිය කල් පසුවි ඇති බවත් එය දීර්ඝ කර දෙන ලෙස | දින දීර්ඝ කිරිමට කටයුතු කර දෙන බව. | පරිපාලන ග්‍රාම නිලධාරි | මාර්තු 15 |
| පඩිකාරමඩුව ගැමුණු ගොවි සංවිධානයේ සභාපති කරුණාරත්න මහතා | උප කොන්ත්‍රාත් ඉදි කිරිම් කිරිමට ගොවි සංවිධාන වලට අවස්ථාව දෙන ලෙස | | | |

නියෝජ්‍ය ව්‍යාපෘතිය - වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකිම | ඉටු කිරිම ගත වන කාලය |
|---|---|---|---|---|
| උල්පත්ගම ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික කේ.කරුණාරත්න මහතා | උල්පත්ගම fc 4 ඇල පිළිබඳව විමසීම් කරන ලදී. | ඉදිරියේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන බව. | වා.ඉ | |
| මූලස්ථාන කෘෂිකර්ම උපදේශක දිසානායක මහතා | මේ වසරේ බිත්තර වී හා පැරණි වගාව සිදු කිරිමට බලාපොරොත්තු වන බව පසුගිය වසරේ ලබා දුන් බිත්තර වී පිරිසිදු කිරිමේ යන්ත්‍ර වල ක්‍රියාකිරීම පිළිබඳ නැවත පුහුණුවක් ලබා දෙන බව. | | | |
| නේවාසික ව්‍යාපෘති කළමණාකාර ඒකනායක මහතා | ඒකාබද්ධ ක්‍රියාත්මක සැලැස්ම හා පදනම් දත්ත සමීක්ෂණ කටයුතු සිදු කරන බව.කසල බඳුන් රක්ෂිත ගල් කණු,දැන්වීම් පුවරු,උප ව්‍යාපෘති සකස් කර ඇති බව. | | | |

වෙනත් -

01. මෙම මස 15 දින පැවැත්වෙන පිරිත් පිංකමේ කටයුතු පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදි.

02. වාරිමාර්ග කළමනාකරණ අංශයේ අතිරේක අධ්‍යක්ෂ ආර්.පී.එම්.දිසානායක මහතා විසින් එවන ලද ගොවිජන සංවර්ධන ජනරාල්ගේ අංක 2018.11.26 දිනැති චක්‍රෙල්ඛ 23/2018 " මෙතෙක් කිසිදු කෘෂිකාර්මික ඉඩම් ලේඛනයක ඇතුලත්ව නොමැති ගොඩ ඉඩමක් අයිතිකරුගේ ඉල්ලීම මත කෘෂිකාර්මික(ගොඩ ) ඉඩම් ලේඛනයට ඇතුලත් කිරීම හා යම් ඉඩමක් කෘෂිකාර්මික ඉඩමක් නොවන බව ප්‍රකාශ කිරීම. " ලිපිය හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018.11.26 දිනැති කෘෂිකර්ම අමාත්‍යාංශයේ චක්‍රලේඛ 5/2018 " අපි වවලයි අපි කන්නේ " කෘෂිකාර්මික සංවර්ධ කඩිනම් වැඩසටහන් ලිපිය ඉදිරිපත් කරන ලදි.

අද දිනයේ පෙර කන්න තිරණ අනුව , යල් කන්නයට සුදානම් වන ලෙසත්,පිරිත් පිංකම සාර්ථක කර ගැනීමට සියලු ගොවි සංවිධානවල සහයෝගය ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරමින් ප.ව 1.30ට පමණ ව්‍යාපාර කළමණාකර මහතා විසින් ව්‍යාපාර කමිටුව සඳහා පැමිණි සියළු දෙනාටම නැවත ස්තුති කරමින් ව්‍යාපාර කළමණාකර කමිටුව වැඩ කටයුතු අවසන් කරන ලදි.

.........................................

ඊ.එම්.ඩබ්.කේ. ඒකනායක,
නේවාසික ව්‍යාපෘති කළමනාකරු.

පිටපත් -

1. අධ්‍යක්ෂ, වාරිකළමනාකරණ අංශය/කොළඹ - කා.දැ.ගැ.පි
2. දිස්ත්‍රික් ලේකම්, අ/පුර - කා.දැ.ගැ.පි
3. වාරිමාර්ග අධ්‍යක්ෂ, අ/පුර - කා.දැ.ගැ.පි
4. ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්, , අ/පුර - කා.දැ.ගැ.පි
5. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(අන්තර් පලාත්), අ/පුර - කා.දැ.ගැ.පි
6. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, අ/පුර - කා.දැ.ගැ.පි
7. වැඩ සටහන් අධ්‍යක්ෂ,(පීසිප්)/කොළඹ - කා.දැ.ගැ.පි
8. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, (පීසිප්),වාරිමාර්ග දෙපාර්තමේන්තුව,කොළඹ - කා.දැ.ගැ.පි